# වැවිලි අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින පරිපාලන නිලධාරී තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් කාර්යශීලී, උද්යෝගීමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**පරිපාලන නිලධාරී JM1-1 (II ශ්‍රේණිය)**

**රැකියා පිරිවිතරය :-**

බලයලත් නිලධාරියෙකුගේ අධීක්ෂණයට යටත්ව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ආයතනික පරිපාලන සහ මානව සම්පත් කළමනාකරණයට අදාළ රාජකාරී කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

ව්‍යාපාර පරිපාලන / රාජ්‍ය පරිපාලන /මානව සම්පත් කළමනාකරණය/ ආර්ථික විද්‍යාව හෝ නීති යන විෂයයන්ට ප්‍රමුඛත්වය ලබාදෙමින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබාගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේම අවම වශයෙන් වසරකට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) 1 ශ්‍රේණිය තනතුරෙහි අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම සහ අ.පො.ස (උ. පෙ) විභාගයෙන් එක් වාරයක් තුළදී අවම වශයෙන් විෂයයන් 03 ක් සමත්ව තිබීම.

සිංහල ඉංග්‍රීසි භාෂාව සහ පරිගණක භාවිතය පිළිබඳ දැනුම අත්‍යාවශ්‍ය වේ.

**වැටුප් පරිමාණය :**

JM 1-1-02/2006 රු.42,600–10Xරු.755 – 18Xරු.1135 – රු. 70,580/=

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2006 අනුව මාසික ආරම්භක වැටුප් පියවර රු. 42,600/= හා ජීවන වියදම් දීමනාව රු. 7,800/= රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

**තෝරා ගැනීම :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**පොදු කොන්දේසි**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවාගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.
- සියලුම තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටුවන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයෙහි 04 ඡේදය ප්‍රකාරව පිහිටුවනු ලැබේ.

**වෙනත් ප්‍රතිලාභ :**

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර, මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

**අයදුම් කිරීම :**

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ **www.srilankateaboard.com** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග 2021 මාර්තු 10 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි. ප.තැ. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**

**ශ්‍රී ලංකා තේ මණ්ඩලය,**

**574, ගාලුපාර, කොළඹ 03.**